කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

**GENERAL WEATHER FORECAST FOR SRI LANKA**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

2020 ජූලි මස 28 දින සඳහා කාලගුණ අනාවැකිය
2020 ජූලි මස 27 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

දිවයිනේ, විශේෂයෙන් නිරිත දිග ප්‍රදේශවල වැසි තත්වයේ තරමක වැඩිවීමක් ජූලි මස 28 දින සවස් කාලයේ සිට ඉදිරි දින කිහිපයේදී අපේක්ෂා කල හැක.

බස්නාහිර, සබරගමුව, වයඹ සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් සහ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වර්ෂාපතනයන් ඇති විය හැක.

ඌව, නැගෙනහිර සහ උතුරු-මැද පළාත්වලත් මුලතිවු සහ වවුනියාව දිස්ත්‍රික්කවලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට අකුණු මගින් සහ තාවකාලික තද සුළං මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

කළුතර සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශවල මුහුදු රළ ඉහළ යාම හේතුවෙන්, මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් පවතී. වෙරළ ආසන්නයේ ජීවත්වන ජනතාව මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

Ecc Staff
pls inform to relevant stakeholders
27/07/2020

**WEATHER FORECAST FOR 28 JULY 2020**
**Issued at 12.00 noon on 27 July 2020**

**The showery condition over the island, particularly in south-western parts is expected to enhance to some extent during next few days from the evening of 28 July.**

Showers or thundershowers will occur in Western, Sabaragamuwa, North-Western and Central provinces and in Galle and Matara districts. Heavy rainfalls above 100 mm are likely at some places in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts.

Showers or thundershowers will occur at a several places in Uva, Eastern and North-central provinces and in Mullaitivu and Vavuniya districts in the evening or night.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity and localized strong winds during thundershowers.**

**Coastal inundation is likely along the coast extending from Kalutara to Potuvil via Galle and Hambantota due to the effect of swell waves. People who are living in coastal areas are requested to be vigilant in this regards.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2020/7/27
Time : 12 : 36 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2020 ජූලි මස 27 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

| වැසි තත්ත්වය: |
| --- |
| දිවයිනට ඊසාන, නැගෙනහිර සහ ගිනිකොන දෙසින් වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ඇතැම් ස්ථානවලට තද වැසිද ඇතිවිය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |
| සුළඟ: |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. මාතර සිට හම්බන්තොට සහ පොතුවිල් හරහා මඩකළපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා වැඩි විය හැකි අතර කොළඹ සිට පුත්තලම සහ මන්නාරම සහ හරහා කන්කසන්තුරේ දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩි විය හැක |
| මුහුදේ ස්වභාවය: |
| මාතර සිට හම්බන්තොට සහ පොතුවිල් හරහා මඩකළපුව දක්වා සහ පුත්තලම සිට මන්නාරම දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.<br><br>කළුතර සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර්. 2.0 – 3.0 ක් පමණ (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.<br><br>ධීවර සහ නාවුක ප්‍රජාව සහ වෙරළ ආසන්නයේ ජීවත්වන ජනතාව මේ පිලිබදව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. |

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 27 July 2020**

| **Condition of Rain:** |
| --- |
| Showers or thundershowers will occur at times in the Northeastern, Eastern and Southeastern deep sea areas to the island, heavy showers are likely at some places also. Showers or thundershowers will occur at several places in the other sea areas around the island. |
| **Winds:** |
| Winds will be Westerly to South-westerly in the sea areas around the island. Wind speed will be **(30-40) kmph**. Wind speed can increase up to **(50-60) kmph** at times in the sea areas extending from Matara to Batticaloa via Hambantota and Potuvil. Wind speed can increase up to **(50-55) kmph** at times in the sea areas extending from Colombo to Kankasanturai via Puttalam and Mannar. |
| **State of Sea:** |
| The sea areas extending from Matara to Batticaloa via Hambantota and Potuvil and from Puttalam to Mannar can be rough at times. The other sea areas around the island can be fairly rough at times.<br><br>**There is a possibility that near shore sea areas off the coast extending from Kalutara to Potuvil via Galle and Hambantota, may experience surges due to the effect of swell waves, having 2.0 – 3.0 m height (this is not the height of nearshore waves).**<br><br>**Naval and fishing communities and those who are living in coastal areas are requested to be vigilant in this regards.** |

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි